


**සිංහල භාෂාව හා සාහිත්‍යය 1 ප්‍රශ්න පත්‍රය, කාලය - පැය 1යි**

**දේශක : ලක්ෂ්මන් අමරසූරිය, නාලන්දා විද්‍යාලය , කොළඹ 10**

**සැ.යු.**

සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ප්‍රශ්න අංක 1 සිට 40 තෙක් දී ඇති (1) (2) (3) (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවාද පිළිපදින්න.

අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

1.මහජන සේවයේ නියුතුවන්නට කරන්නන් **<u>එක්වැම්ගෙයින් බැසිය</u> යුතු යැයි** එහිදී කියැවිණි.

i අවංක ලෙස ක්‍රියා කළ යුතු යැයි ii සමාජයෙන් ඉවත් නොවිය යුතු යැයි

iii ශ්‍රමාභිමානීන් විය යුතු යැයි iv පොදු යහපත සලසන්නන් විය යුතු යැයි

**2.<u>අත හයිය නම් බත නොවරදින බව</u>** තාත්තා නිතරම කියන දෙයකි.

i සිගමන් ඉල්ලීමෙන් ආහාර ලැබෙන බව ii කුඹුරු කෙටූ කල බත් ලැබෙන බව

iii වැඩ කිරීමෙන් ලාභ උපයා ගත හැකි බව iv උත්සාහය ඇත්නම් ජය ගත හැකි බව

3. වල් අලි උවදුර නිසා **<u>මුලු සේසතම</u>** නැති වූ බව ගම්මු පැවසූහ.

i නිවසේ තිබූ සේසත් මුතුකුඩ විනාශ වූ බව ii සියලු නෑ හිත මිතුරන් අහිමි වූ බව
iii සියලු සැප සම්පත් විනාශ වූ බව iv සන්තක සියලු ධන දේපල අහිමි වූ බව

4. බඩු මිළ ඉහළ යාමත් සමග තම **<u>මඩිය තර කර ගැනීමට</u>** බොහෝ වෙළෙන්දෝ උත්සාහ ගත්හ.

i භාණ්ඩ වැඩි වැඩියෙන් විකුණා ගැනීමට ii අනිසි ලෙස ලාභ ලැබීමට
iii තම ගබඩා සම්පූර්ණයෙන්ම පුරවා ගැනීමට iv ව්‍යාපාර සඳහා වැඩිපුර මුදල් යෙදවීමට

- අංක 5 සිට 10 තෙක් ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැන සඳහා වඩාත් සුදුසු පදය තෝරන්න.

5.අත්පත් කරගත් විෂ්මිත ජයග්‍රහණය එක්වර.......................වූවක් නොව විමර්ශනාත්මකව සිදුකළ

සැලසුම්වල ප්‍රතිඵලයකි.

i ප්‍රාදුර්භූත ii ප්‍රභාවිත iii ප්‍රස්තුත iv ප්‍රත්‍යවේක්ෂණ

02

6. බොහෝ රසවත් බිහිකිරීම් සඳහා නිර්මාණකරුවා සතු .........................ප්‍රතිභාව හේතුවන බව විචාරකයා මතුකොට දැක්විය.

i ආකස්මික ii නෛසර්ගික iii නෛර්යාණික iv නෛපුණ්‍යය

7. හෙළයේ මහා ගත්කරු හෙවත් මාර්ටින් වික්‍රමසිංහ සූරීන් හෙළ සාහිත කෙත අස්වද්දන්නට කළ ........................මෙහෙවර ප්‍රශංසනීය වේ.
i අභිවන්දනීය ii අනභිභවනීය iii අභිනන්දනීය iv අභිප්‍රේරණීය

8. රටක සවිමත් හා නිරෝගී බවින්.......................පරපුරක් බිහි කිරීම උදෙසා අවශ්‍ය පදනම සකසාගත යුතුය.

i අනන්‍ය ii අනූන iii අනුරාගී iv අනුලෝම

9.......................පැවත එන සිංහල චාරිත්‍රානුකූලව ස්වකීය විවාහ මංගලෝත්සවය පැවැත්වීමට කටයුතු සූදානම් කොට තිබිණි.

i චිරන්තනව ii චිත්තාකර්ෂණීයව iii විරාගතව iv චිරපරිචිතව

10. වර්ජකයෝ තම වෘත්තියට අදාළවන සේ වැටුප් ......................ඉවත්කර දෙන ලෙස බල කරමින් සංකේත වැඩවර්ජනයක නිරත වූහ.

i විස්තීරතා ii විෂමතා iii සංකූලතා iv සංලක්ෂ්‍යතා

11. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

i දුෂ්කර, සම්ප්‍රධාන, විරෝධාර, කොට්ඨාසය ii ප්‍රස්තාරය, ශිෂ්ටාචාරය, දෘෂ්ටිය, අලුයම

iii මද්‍යසාරය, විමර්ශණය, මර්ධනය, ප්‍රතිඵලය iv ශ්‍රව්‍යගෝචර, චෛත්‍යය, ඖෂධය, විශේශණය

12. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වාක්‍යය තෝරන්න.

i පෞරාණික අනුරාධපුර නගරයේ නෂ්ඨාවශේෂ සංචාරකයන්ගේ සිත් ඇද ගනී.

ii ඓතිහාසික වටිනාකමකින්ද යුක්ත වූ චිත්තාකර්ශනීය ස්තූප පැරණි නරපතීන්ගේ අනර්ග නිර්මාණයි.

iii විරෝධාර රණකාමී සෙන්පති තෙමේ සෙබලුන් ධෛර්යයට පත්කොට දේසද්‍රෝහී සතුරු හමුදාව

විනාශයට පත් කළේය.

iv පරිගනක විද්‍යා පාඨමාලාවේ විශිෂ්ට සාමාර්ථ්‍යය ලත් සියලු දෙනාම ත්‍යාග ලැබූහ.

13. අකාරාදි පිළවෙලට නම් යෙදී ඇති වරණය තෝරන්න.

i බද්දේගම, වන සරණ, මනුතාපය, දේව හස්තය

ii අල්විස් පෙරේරා, කුඩලිගම, විමලරත්න කුමාරගම, සාගර පළන්සූරිය

iii හංස සංදේශය, ගිරා සංදේශය, සැළලිහිණි සංදේශය, පරෙවි සංදේශය

iv ලෝවැඩ සඟරාව, බුදුගුණාලංකාරය, ගුත්තිලය, කාව්‍යශේඛරය

03

14. එක් එක් වචනවල මුලකුරෙහි ඇදය,දීර්ඝ පාපිල්ල,ඉස්පිල්ල සහ ඇලපිල්ල පිළිවෙලින් යෙදී ඇති වචන සහිත පද පේළිය තෝරන්න.

i පැල්මඩුල්ල, කුරුණෑගල, මිහින්තලය, පානදුර ii මැදිරිගිරිය, සූරියවැව, පින්නදූව, ආනමඩුව
iii කොට්ටාව, මීතිරිගල, මාවරල, හෝමාගම iv පැණිදෙණිය, පාමංකඩ, මාවරමණ්ඩිය, කැරගල

15. අන්‍යාර්ථ සමාසය සඳහා උදාහරණ පදයක් ලෙස සැලකෙන්නේ,
i ලඹ සවන් ii තුන්බිය iii කුකවි iv ඇත්දළ

16. තද්ධිත පදයක් යෙදී නැති වරණය තෝරන්න.
i පිහිනුම් තරගයෙන් විශිෂ්ට ජයක් අත්කර ගැනීමට අප පාසලේ ක්‍රීඩකයෝ සමත් වූහ.
ii ස්වර්ණමය ප්‍රතිමාවක් රජත ජාලයකින් වෙළාගත් කළක් මෙන් ඇය බැබලුණේය.
iii තොටියා ගඟ හරහා ඔරුව පදිමින් ගමටකළ සේවය අගය කළ යුතුය.
iv ළමා ළපටියෝ ගඟ දියට බැස සිත්සේ ප්‍රීති වූහ.

17. කෘදන්ත පදයක් යෙදී ඇති වරණය තෝරන්න.
i ගෙවිලිය වැදම රැගෙන කෙතට හනි හනික පිය නැගුවාය.
ii අපේ පුරාණ උපදේශාත්මක කියමන්වලින් යුතු සුභාෂිතය මහඟු මාර්ගෝපදේශකයකි.
iii මහගමසේකර ප්‍රවීණ ගීත රචකයෙකු මෙන්ම සිත්තරුවෙක් ද විය.
iv ගුරුවරු සිසුන් යහමගට ගැනීමට මහත් වෙහෙසක් දරති.

18. සන්ධි විධියකට උදාහරණයක් නොවන පදයක් ඇති පද පේළිය තෝරන්න.

i අරුණෝදය, ගනඳුර, නිලුපුල්, ප්‍රතිචාර
ii විදේශාධාර, ඔවුනොවුන්, පුනරුක්තිය, රියදුරා
iii කම්මල, අත්‍යුත්තම, දෙයාකාර, කෘතෝපකාර
iv දැත,සුළැඟිල්ල, අමාත්‍යාංශය, ගෞරවාදර

- තද කලු අකුරින් මුද්‍රිත කොටස් වෙනුවට යෙදිය හැකි වඩාත්ම ගැළපෙන තනිපදය තෝරන්න.

19. අතීතයේ සිටම **<u>අඛන්ඩව පැවත එන</u>** චාරිත්‍ර වාරිත්‍ර රැක ගැනීම අපේ වගකීමයි.
i සම්භාවනීය ii සදාතනික iii විරාගත iv ආවේණික

20. සාහිත්‍යකරුවෙකු තුළ ඇති **<u>උචිතානුචිත දේ තෝරා බේරා ගැනීමේ</u>** හැකියාව මත හොඳ සාහිත්‍ය
නිර්මාණයක් බිහිවිය හැකිය.
i ව්‍යුත්පත්තිය ii ප්‍රතිභාව iii පරිකල්පනය iv රසාවේසනය

21. සීගිරි ගී ලියූවන් අතර **<u>විදග්ධ</u>** කවීන්ද සිටිබවට සාක්ෂි හමුවේ.
i විශේෂ ii ප්‍රසිද්ධ iii විදේශීය iv නිපුණ

- අංක 22 සිට 24 දක්වා ඇති එක් එක් පද යුගලෙහි දෙවන පදය පළමු පදයට අර්ථයෙන් සමාන ද,අර්ථයෙන් විරුද්ධ ද,පළමු වැන්නෙහි අර්ථය වැඩි කරයි ද,වෙනස් කරයි ද, යන්න දී ඇති වරණ අතුරින් තෝරන්න.

22. නන්දන - අභිනන්දන : i සමාන ii විරුද්ධ iii වැඩි iv වෙනස්

04

23. ශතාබ්ධ - ශතවර්ෂ : i සමාන ii විරුද්ධ iii වැඩි iv වෙනස්
24. වෘත්තය - වෘත්තිය : i සමාන ii විරුද්ධ iii වැඩි iv වෙනස්

- අංක 25 සිට 29 තෙක් ඇති එක් එක් හිස්තැන සඳහා ව්‍යාකරණානුකූලව වඩාත් සුදුසු පදය තෝරන්න.

25. මහාචාර්ය සෙනරත් පරණවිතානයන් විසින් සීගිරි ගී බොහෝ ගණනක්..................
i කියවීය ii කියවූහ iii කියැවිණි iv කියවී

26. .......................පැමිණ සිටින බව මුලසුනෙන් පැවසිණි.
i සාමාජිකයෝ සියල්ලෝම ii සාමාජිකයින් සියල්ලෝම
iii සාමාජිකයින් සියල්ලන්ම iv සාමාජිකයෝ සියල්ලන්ම

27. .......................වනාහී සමාජය පිළිබඳව අවබෝධයකින් යුතුව ජීවිත විවරණය කරන ප්‍රාඥයෝය.
i සාහිත්‍යකරුවන් ii සාහිත්‍යකරුවෝ
iii සාහිත්‍යකරුවා iv සාහිත්‍යකරුවෙකු

28. නාට්‍ය ශිල්පීහු.......................තානාපතිවරයා අතින් තෑගි ලැබූහ.
i කිහිපදෙනෙකුන් ii කිහිපදෙනෙකු iii කිහිපදෙනෙකුම iv කිහිපදෙනෙක්

29. ඩෙංගු උණ පැතිර යාම පිළිබඳව වෛද්‍යවරු වගකිව.............................
i යුත්තෝ නොවෙති ii යුත්තන් නොවේ iii යුත්තෝ නොවේ iv යුත්තන් නොවෙති




# සිංහල

30. දී ඇති අක්ෂර ගැළපීමෙන් නිර්මාණයවන නිවැරදි ග්‍රන්ථ නාමය ඇතුළත් වරණය තෝරන්න.
i ප යෝ ත පී රා ම ii මා ගා වා යා ලි iii තු ත රි ක් ව න iv ලං ගු වි පු රා

31. යුගල පදයක් නොවන පදයක් ද ඇතුළත් පද පේළිය තෝරන්න.

i චතුපිටි, ගුණාගුණ, උස්මිටි, හරිබරි ii පොතපත, ලටපට, තට්ටු බට්ටු, ඇහැකන
iii ජරමර, ටයිබයි, රෙදි පෙරෙදි, සද්ද බද්ද iv දූක සැප, දූක් මුසු, දඩි බිඩි, නඩු හබ

- අංක 32 සිට 33 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්ථාව පිරුළ තෝරන්න.

32. නිෂ්ඵල උත්සාහයක් දැරීම
i කතාව දෝලාවෙන් ගමන පයින් ii බීරි අලින්ට වීණා වාදනය කිරීම
iii අතු කඩා මොර කනවා වාගේ iv අබ කෑ මිනිහාගේ නහය දනවා වාගේ

33. අකමැත්තෙන් යම්කිසි කාර්යයක් සිදු කිරීම
i අශ්වයාට අං ලැබුණා වාගේ ii අහසට ඉනිමං බදිනවා වාගේ
iii උගුරට හොරා බේත් කනවා වාගේ iv අබරා සිල් ගත්තා වාගේ

- අංක 34 සිට 35 තෙක් ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න

34 ළමා පරපුර සාහිත්‍ය රස වින්දනයට යොමු කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන් සාර්ථක ලෙස යොදා ගත හැකිය.

05

i රූපවාහිනී වැඩසටහන් මගින් සාහිත්‍ය රසය විඳීමට ළමයින් උනන්දු කරවීමට පුළුවන.
ii ළමයින් සාහිත්‍ය රසවින්දනය පිළිබඳ මුල් අත්දැකීම් ලබා ගන්නේ ද රූපවාහිනිය නැරඹීමෙනි.
iii රූපවාහිනියේ බලපෑම මත සාහිත්‍ය රස වින්දනය ළමයින්ගේ විනෝදාංශයක් බවට පත් වී ඇත.
iv සාහිත්‍ය රසාස්වාදය හා ළමා පරපුර අතර පැවතිය යුත්තේ අඛණ්ඩ සම්බන්ධයකි.

35 මානව සබඳතා,චිරස්ථායී භාවය හා සමානාත්මතාව යන උදාර පරමාර්ථ නිස්සාරභාවයට හැරවීමෙහිලා නූගත්කම ප්‍රධාන සාධකයකි.

i චිරත්තන මානව සබඳතා විකාශනය නොකොට පෙරට යෑම සඳහා නූගත්කම සාධකයක් නොවිය යුතුය.
ii මානව ප්‍රගතිය උදාරත්වයට පත් කිරීමට නම් උගත්කම ඇති කිරීම හා නූගත්කම අතර සම්බන්ධයක් නොවිය යුතුය.
iii උගත් නූගත් භේදය නැතිකර ලිය හැක්කේ මානව සම්බන්ධතාව සමානාත්මතාව සහ ස්ථිරසාරබව ඇතිකිරීමෙනි.
iv සමාජ සමානාත්මතාව තිරසාර සම්බන්ධතාව හා මානව ප්‍රගතිය ඇතිකළ හැක්කේ අධ්‍යාපනය මගින්ය.

- 36 සිට 40 දක්වා එක් එක් ප්‍රශ්නයේ ඇතුළත් 1,2,3,4 යන වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

36. i ප්‍රියසාදයට රැස් වූ සමහරු ගී ගයද්දී ඇතැමෙක් ඒ තාලයට නැටූහ.
ii සියලු නෑදෑ හිතවත්හු මේ නිවේදනය පිළිගනිත්වා.
iii මැණියන් විසින් අප රක්ෂා කරන්නීය.
iv ගං වතුරින් වැව් ගම් බිම් රැසක් විනාශ වූහ.

37. i ශිෂ්‍ය නායකයෝ වැඩමුළුවට පැමිණ ඇත.
ii වල්ඌරු රංචුව ගම්වැදී හේන් විනාශ කරයි.
iii ක්‍රීඩකයෝ සිව්දෙනෙක් ඔලිම්පික් තරග නියෝජනයට එක්වූහ.
iv වෛද්‍යවරුන් බොහෝදෙනෙකු සායනයට සහභාගී වූහ.

38. i ඇත්තු සමග පැටවුන්ද ගම්මානයට වැදුනහ.
ii මිනිසුන් නොසැලකිලිමත්කමින් ඩෙංගු මදුරුවෝ බෝකරති´යි සෞඛ්‍ය පරීක්ෂකවරයා පැවසීය.
iii අප පාසලේ දක්ෂ පාපන්දු ක්‍රීඩකයින් ඇත.
iv තඩාගයේ පියුම්හු හිරුකිරණින් විකසිත වූහ.

39. i වෛද්‍යවරියක වූ ප්‍රසාදි දක්ෂ නර්ථන ශිල්පිනියක් ද වූවාය.

ii රියදුරන් ප්‍රවේශමව රිය ධාවනය කළ යුත්තෝය.
iii දෙමාපියෝ සියල්ලන්ම රැස්වීමට සහභාගී වූහ.
iv රාජ්‍ය සාහිත්‍ය උත්සවයේ සම්මාන ලබන්නේ ලේඛකයන්ය.

40. i දරුවෝ විසින් දෙමාපියන්ට දිවිහිමියෙන් සැලකිය යුතුය.
ii කම්කරුවන් වැඩකරද්දී අධීක්ෂකවරු ඒවා අධීක්ෂණය කළහ.
iii මම විශිෂ්ට ලෙස විභාගයෙන් සමත් වුවහොත් ගුරුවරු සතුටු වෙති.
iv අප මව්තොමෝ දඹදිව බලා හෙට පිටත් වෙති

## සිංහල භාෂාව හා සාහිත්‍ය
## II කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ළකුණු ගණන 80 කි.**

1. (i) සිට (x) තෙක් ඇති සියලුම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.
කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් වර්ගාන්ත අනුනාසික අක්ෂර දෙකක් සහ උෂ්මාක්ෂර අක්ෂර දෙකක් ලියා දක්වන්න.

ii.පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස්ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

සිස්‍රයෙන් ඉහළ යන ජීවන වියදම අඩු කිරීමේ උපාය මාර්ග කිහිපයක් වාර්ථාවේ ඇතුළත් කොට තිබිණි.

iii.පහත දැක්වෙන එක් එක් වචන අයත්වන සන්ධි විධිය නම් කරන්න.

(අ) ග්‍රාමෝදය (ආ) පුනරුත්පත්තිය

iv.පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක කර්මකාරක වාක්‍ය බවට හරවා ලියන්න.

(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.

(ආ) ගුරුවරු විනයගරුක ශිෂ්‍යන් අගය කරති.

v.පහත (අ) (ආ) කොටස්වල දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් තනි පදයක් ලියන්න.

(අ) වෛකල්පිත (ආ) ප්‍රත්‍යක්ෂ

vi.පහත සඳහන් වාක්‍ය ඛණ්ඩවල තදකළු අකුරින් මුද්‍රිත පද අයත්වන ව්‍යාකරණ වර්ගය නම් කරන්න. (අ) කලායතනයේ ශිල්පීන් විසින් ඉදිරිපත්කළ **නැටුම්** කාගේත් සිත් ගත්තේය.
(ආ)ලක්දිවට පැමිණි විදේශිකයෝ **පෞරාණික** ශ්‍රී විභූතිය දැක තුටු වූහ.

vii.පහත සඳහන් පද්‍ය ඛණ්ඩ දෙකහි තද කළු අකුරින් දැක්වෙන පද අයත්වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) මිතුරු කමින් පෙරට **එතොත්** දූවිල්ලත් ඒක්ක වුනත්
(ආ) වැහිවතුර ඉහිනවා නම් ඔවුන් විහිළුවට කුරුල්ලෝ ඉගිල්ලී **වරෙන්** නුඹ මා ලඟට

viii. පහත දැක්වෙන යෙදුම් සඳහා හේන් ගොවිතැන ආශ්‍රිතව භාෂා රටාවේ යෙදන පදවල අරුත් දක්වන්න.
(අ) අලියන්වෙලාව (ආ) වාං පතුල්

ix.පහත සඳහන් (අ) සහ (ආ) යෙදුම්වල පළමු වචනය සමග දෙවැනි වචනයේ නොගැලපීමක් ඇත.වඩාත් ගැළෙපන සේ පළමු වැනි වචනය හෝ දෙවැනි වචනය සකස්කර ලියන්න.
(අ) පරිත්‍රාණ දෙසුම (ආ) උයන් පාලකයා

x.පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියා දක්වන්න.
(අ) සහමුලින්ම උදුරා දැමීම (ආ) බිත්තර වලින් උපන්

02

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරෙන් ඒකක් තෝරාගෙන වචන 250කට නොඅඩු වන සේ රචනාවක් ලියන්න. වරහන් තුළඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න

(අ) උගත්කම නිසා විනය ඇතිවන අතර විනය නිසා සමාජ වගකීම් පිළිබඳ යෝග්‍යතාවට පාත්‍ර වෙතැයි පැරණි පඩි වදනක් ද වෙයි. නිවසින් ඇරඹී පාසලින් හා සමාජයෙන් වර්ධනයවන මේ කරුණු දෙක තමාගේත් සමාජයේත් දියුණුවට හේතුවන්නේය. විනය ගරුක වීම සංවර්ධනයේ උතුම්ම මාර්ගයකි.

(ආ) දේශයක පවතික ස්වාභාවික සම්පත් අතර වනජීවින්ට හිමි වන්නේ උසස් තැනකි. වන සතුන් නැරඹීම සඳහා විදේශිකයන් මෙරටට පැමිණෙන බැවින් වන සත්ත්ව සම්පත විදේශ විනිමය උල්පතකි. කෙටිකාලීන වාසි අපේක්ෂා කරන ආත්මාර්තකාමීන් වනසතුන්ට කරන හානි පිළිබඳව මාධ්‍ය හරහා ද තොරතුරු නිතර අසන්නට දකින්නට ලැබේ. මේ ජාතික සම්පත ආරක්ෂා කිරීම සඳහා වන සංරක්ෂණ දෙපාර්තෙමේන්තුව විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සතුටට කරුණකි. මේ සඳහා මහජන සහයෝගයද අත්‍යාවශ්‍යය.

(ඉ) ක්‍රීඩා ක්ෂේත්‍රයේ ශ්‍රී ලංකාවට සුවිශේෂී ස්ථානයක් ලැබී ඇත. ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොව ජවන හා පිටිය ආදී ක්‍රීඩා ඉසව් ඔස්සේ අප ලබා ඇති ජයග්‍රහණ මගින් ලංකාව ලෝක තලයේ රැඳවීමට හැකිවීම ප්‍රීතියට කරුණකි. කායික,මානසික,සමාජීක මෙන්ම සංස්කෘතික වර්ධනය කෙරේ ක්‍රීඩාව මගින් ඉටුවන සේවය අතිවිශාලය. ක්‍රීඩාවේදී මුල්තැන දියයුත්තේ ජයග්‍රහණයටම නොව සහභාගීත්වයටයි.

(ඊ) විද්‍යාව හා තාක්ෂණය අද ඉතා ඉහළ මට්ටමකට දියුණු වී ඇත. සාමකාමී ලොවක් ගැන කතාකරන ලෝක බලවත්තු අතිශයින්ම සූක්ෂම යුද්ධායුධ නිෂ්පාදනය සඳහා විද්‍යාව හා තාක්ෂණය උපයෝගීකර ගනිති. යුධ බියෙන් හා ගිනි දැල්වලින් තොර සාමකාමී නිසංසල ලෝකයක ජීවත්වීම දසදහස් ගණන් ජනයාගේ එකම අභිලාෂයයි. බලකාමයට ගිජු නොවී සමස්ත ලෝකයම සොඳුරු තැනක් බවට පත් කිරීම ලෝක බලවතුන්ගේ හා ජගත් සංවිධානවල අභිප්‍රාය විය යුතුය.




# සිංහල

3. පහත දැක්වෙන පාඨය වචන 55 -65 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

බස දන්නා සියලු දෙනාට රස වින්දනයේ ශක්‍යතාව තිබෙන නමුත් නිර්මාණ විෂයෙහි මෙන් වින්දන විෂයෙහි මෙන්ම වින්දන විෂයෙහි ද පරිචය ඇත්නම් මැනවි. බස දැනීම වූ කලී එක් එක් කෙනා තුළ එක් එක් ප්‍රමාණයට පිහිටා තිබිය හැක්කකි. යන්තම් වචනාර්ථය තේරුම් ගැනීම ද බස දැනීමක් වේ. එහෙත් බස සම්පූර්ණයෙන් දැන ගැනීමට නම් බස් වහරේ විවිධාර්ථ වටහා ගත මනාය. මතුපිටින් පෙනෙන වාච්‍යාර්ථය නොව ව්‍යංගාර්ථයද අවබෝධ කළ යුතුය. බසේ බුද්ධිගෝචර වන කොටස පමණක් නොව හෘදය ගෝචරවන කොටසද දත යුතුය.

රස වින්දනයට බස දැන ගැනීම අවශ්‍ය වන අතර කාව්‍ය රස වින්දනය හේතු කොට ගෙන බස පිළිබඳ දැනුමද වර්ධනය වේ. මක් නිසාද යත් බස සූක්ෂම ලෙස පරිහරණය කරන්නේ කවීන් වන බැවිනි. කවියා භාෂාවේ ඇති මුළු ශක්‍යතාවෙන් ප්‍රයෝජන ගන්නා අයෙකි. පිසමන් දන්නා අරක්කැමියා නොයෙක් ද්‍රව්‍ය ගෙන නොයෙක් අයුරින් මිශ්‍රකොට අපූරු රසයෙන් යුත් අහර පිසින්නා සේම කවියා ද නොයෙක් වචන ගෙන නොයෙක් අරුත් ගෙන විවිධ ලෙස මිශ්‍ර කොට පෙර නොවූ විරූ ව්‍යංගාර්ථ ශබ්ද ධ්වනි ඇතිකොට අපූරු රසයක් නිර්මාණය කරයි.

4. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

සත්‍ය සිද්ධියක් නැතහොත් සත්‍ය ප්‍රවෘත්තියක් පදනම් කරගෙන හෝ එසේ නැතහොත් සම්පූර්ණෙයන් කල්පිත ස්වරූපෙයන් හෝ නිර්මාණය කරනු ලබන හෙයින් නවකතාව, කෙටි නව කතා, කෙටි කතාව යන සාහිත්‍යාංග තුනද ප්‍රබන්ධ කතා හෙවත් කල්පිත කතා ගණයට වැටේ. දීර්ඝ ඉතිහාසයක් ඇති මේ ප්‍රබන්ධ කතාව විකාසනය වීමෙන් පළමුව නවකතාවද ඉක්බිතිව නවකතාවේ ශාඛා දෙකක් වශයෙන් කෙටි නව කතාව සහ කෙටි කතාව යන නව සාහිත්‍යාංගත්‍රය ඒවාටම විශේෂ වූ ශිල්ප ධර්ම සහිතව දියුණු වූයේය. කෙටි

03

කතාව අ◌ාරම්භ වූයේ දහනව වන ශත වර්ෂෙය්දී බව කියනු ලැබේ. අද ලෝ පුරා ව්‍යාප්ත ජනප්‍රිය සාහිත්‍යාංගයක් බවට පත්ව ඇති කෙටි කතාව වස්තුවිෂය කාර්ය සිද්ධිය රචනාධර්ම යනාදී අංශ විසින් නවතම ක්ෂේත්‍ර ගවේෂණය කරමින් සිටිනු පෙනේ.

i කෙටිකතාවේ ආරම්භය සිදු වූ බව සැලෙකන්නේ කවර ශත වර්ෂෙය්දිද?

ii නවකතා, කෙටි නව කතා හා කෙටිකතා යන සාහිත්‍යාංග ප්‍රබන්ධ කතා ලෙස සලකන්නේ ඇයි?

iii මේ ඡේදයේ අන්තර්ගත මුඛ්‍යාර්ථය කුමක්ද?

iv පහත සදහන් පදවල අදහස් ලියන්න.

අ. කල්පිතයක් ආ. විකාසනය

v කෙටි කතාවේ වස්තු විෂය යන්නෙන් මේ ලේඛකයා අදහස් කරන්නට ඇත්තේ කුමක්ද?

5. ශීඝ්‍රයෙන් පැතිර යන ඩෙංගු උවදුරෙන් මහජනතාව බේරා ගැනීම ජාතික අවශ්‍යතාවයකි. ඔබ ප්‍රදේශයේ ඩෙංගු මර්ධන කමිටුවේ ලේකම් ඔබ යැයි සිතා මෙම රෝගය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස අත්පත්‍රිකාවක් සකසන්න. රෝගය වැළඳීමේ හේතු හා එය වලක්වා ගැනිමය. යෙදිය යුතු උපාය මාර්ග, රෝගයකින් සිදුවන හානිය, රෝගියෙකු බේරා ගැනීම සඳහා ගතයුතු නිවැරදි ක්‍රියා පිළිවෙල යන කරුණු ඔබ සකස් කරන අත්පත්‍රිකාවේ අඩංගු විය යුතුය. (වචන 100 පමණ සෑහේ)

**නැතෙහාත්,**

පැරකුම්පුර මාණ්ඩලික වාර්තාකරු හර්ෂණ සුබසිංහ විසින් ලියන ලද කෙටි සටහනක් පහත දැක්වේ.

- උත්සවය - වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය
- පැවති ස්ථානය - පැරකුම්පුර මහා විද්‍යාලය
- දිනය - 2016.05.20 , වේලාව ප.ව.1.00
- විශේෂ ආරාධිතයෝ - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කීර්තිමත් ආදි ශිෂ්‍ය බ්‍රිගේඩිය ජාන කපුකොටුව
- ජයග්‍රාහී නිවාස ය - මෞර්ය නිවාසය
- විශේෂ කතා - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් සමස්ත ලංකා ජයග්‍රහණ අත්කරගත් ප්‍රදේශයේ විශිෂ්ඨ පාසල පැරකුම්පුර මහා විද්‍යාලයයි.ක්‍රීඩාව ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රතිපාදන තව තවත් ලබා දීමට කටයුතු කරන බව

ඉහත කෙටි සටහන ඇසුරෙන් පැරකුම්පුර මාණ්ඩලික වාර්තාකරු ඔබ යැයි සිතා පුවත්පතක පළකිරිමට සුදුසු වාර්තාවක් සකස් කරන්න.
(මේ සඳහා වචන 100 පමණ ප්‍රමාණවත් වේ )

## සිංහල භාෂාව හා සාහිත්‍ය
## III කොටස

වැදගත්: උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කට පමණක් උත්තර ලියන්න.

1,2,3,4 ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්න වලින් එකකටත් උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. i "පැවිපියනට දරුණු කමින් ලද නම් කියනු නොයෙදෙයි මවුපියන්ගේ ගොත් විසින් බැහැර කරනු මැනව"

(අ). මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දක්ද?
(ආ). මෙම පාඨය අයත් පාඩම අන්තර්ගත මුල් කෘතියේ කතුවරයා කවුද?

ii දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල - යලි ඉපදී ඇති ලක් දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතුවී - පුතුගෙ සිනාවෙනි ඔප වැටුනේ

(අ). ඉහත පදය උ පුටා ගත් පද්‍ය පන්තියේ නම ත්‍රමක්ද?
(ආ). මේ පද්‍ය පන්තියේ රචකයා කවුද?

iii (අ). පරිවර්තිත දියමන්ති මාලය කෙටි කතාවේ මුල් රචකයා කවුරුන්ද?
(ආ). පරිවර්තනය කළ රචිකයාගේ නම කුමක්ද?

iv දේවයිනි, මහත්වූ කෝලාහල ශබ්දයෙක, අපි කුමක් බවත් නොදම්හ.
(අ). මේ ප්‍රකාශය කරණ ලද්දේ කවුරුන් විසින්ද?
(ආ). ජාතක කතා පදනම් කොට ගෙන ලියැවුණු ගී කාව්‍යයක් නම් කරන්න.

v මටද හිමි මේ වංග රාජ්‍යය - ප්‍රබල නරවර පරපුරෙන්
(අ). මේ ප්‍රකාශය කාගේද?
(ආ). මෙම කොටස අයත් නාට්‍යය අයත්වන්නේ කුමන නාට්‍ය සම්ප්‍රදායටද?

vi " ඕකට ගිය මිනිහෙක් කවදාවත් එළියට එන්නේ නෑ.හැබැටම මම දන්නේ නැද්ද මගෙ පුතත් ඔය හිරගෙට ගියා"
(අ). මේ ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින්ද?
(ආ). මේ ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථයේ නම කුමක්ද?

vii එන්නේ කොහි සිටද - කොතැනකටද යන්නේ
ඔබ කුමකටද මා දුටුතැන විමසන්නේ
.................................................................
මිනිසුන් ගිහින් නිතරම ආපසු එන්නේ
(අ). මෙහි ඉතිරි පදය සම්පූර්ණ කරන්න.
(ආ).මෙම කවිපෙළේ රචකයා හැඳින්වූ විරුද නාමය කුමක්ද?

viii අනෙක් කාට කියම්ද? තොපම කොට ඇවිදිනා කටයුතු හෙයින් තොපම අරහයා කියමි.
(අ). මෙලෙස පවසන්නේ කව්ද?
(ආ). මේ කොටස උපුටාගත් පාඩම අයත්වන සම්භව්‍ය කෘතියේ රචකයා කවුද?

02

ix කුඹුක් අතු වතුර අත ගගා නැමිලා දියට
දිය කෙලින හැටි පුංචි මාළුවෝ දුටුවාද?
පුරපසේ සඳ එක්ක තරගයට මෝරන්ට
හුලංදා ඔය කිම්ද මල්වරව ඉල්මහට

(අ). මෙම පැදිය සඳහන් පද්‍ය පන්තියේ රචකයා කව්ද?
(ආ). ඔහු රචනාකළ ප්‍රථම කාව්‍ය සංග්‍රහය ලෙස දක්වා ඇත්තේ කුමණ නිර්මාණයද?

2.පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨයේ කියවා අසා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න

i පැසෙයි නිබඳ සුවදැල් කෙත්වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

(අ). මෙම පැදියෙන් මතුකෙරෙන අදහස කෙටියෙන් ලියා දක්වන්න.
(ආ). මෙම කවියේ දැක්වෙන උපමාවන් ගෙනහැර දක්වන්න.




# සිංහල

ii අපගේ රජ්ජුරුවන්ට අස්න පමණකුත් නොලබන්නමෝ දැන් තොප රාත් පිය දෙම්හ´ යි මස්

අවුළු ආදියත් කෑ නොදෙම්හ´යි වාසි බෙණෙමින් සිංහ නාද ඇසූ මුව පොල්ලන් පරිද්දෙන් තොපගේ

අභීත ශබ්දයෙන්ම උන් භය ගන්වා..................

(අ). මෙම පාඨයේ එන උපමාමය අවස්ථාවන් දක්වන්න.
(ආ). මෙම පාඨය හා සම්බන්ධවන අවස්ථාව කෙටියෙන් ලියන්න

iii තුමුල ගනිත්දා - බාහු බෙලෙන්දා

වෙමි සේ තිදසින්දා

කුරුගිපින්දා කුඹුතල සින්දා
ලම්සේ කෙසරින්දා

(අ). ඉහතින් දැක්වූ කොටස උපුටාගත් නාටයයේ රචකයා ලද විශ්ව සම්මානය කුමක්ද?
(ආ). මේ පාඨයේ එන තිදසින්දා යන්නෙහි අරුත කුමක්ද?

iv කස්තුරි තිලක සැදි නළලත      සුමුටාන

පුල් මහනෙල් මල් දම් හිස      දවටාන

සලෙළුන් යනෙන නිති කැරැ කෙළි      කවටාන

රිවි මුදුනත වන මැද වදූ      සුමුටාන

(අ). මෙහි සුමුටාන යන පද දෙක අරුත් දෙකක් සඳහා යෙදී ඇත. එහි අරුත් දෙක වෙන
වෙනම දක්වන්න.
(ආ). මෙම පද්‍යයේ සඳහන් පිරිසේ ස්වභාවය කෙසේ වීද?

03

v ජාතික රණ දෙරණ     මතේ
ගැටී වැටී මළ     මොහොතේ
සුන්දර සුරඹුන්ගේ     අතේ
නැළවෙන බව සිතනු     පුතේ

(අ). මෙහි දැක්වෙන රූපක අලංකාරය කුමක්ද?

(ආ). මේ කවියේ සරල අදහස සඳහන් කරන්න.

3. මහගමසේකර මහතාගේ "දෑතේ කරගැට සිඹ සනහන්නට " පද්‍ය කෘතිය ඇසුරින්
(අ). ජාතික අභිමානයක්
(ආ). ශ්‍රමාභිමානයක්
මතුවී පෙනෙන ආකාරය නිදසුන් සහිතව ඉදිරිපත් කරන්න. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට
උදාහරණ දෙක බැගින් දක්වන්න.

නැතහොත්

සද්ධර්ම රත්නාවලී කතුවර ධර්මසේන හිමියන් ස්වකීය නිර්මාණයෙහි රසාලිප්ත බව උදෙසා
i බස් වහර උපයෝගී කොට ගත් අන්දම
ii උපමා උපමේය භාවිතය ප්‍රශස්ත අයුරින් යොදාගෙන ඇත. මේ පිළිබඳ විමසීමක යෙදෙන්න.
( නිර්දිෂ්ට කොටසින් නිදසුන් දෙක බැගින් අපේක්ෂා කෙරේ. )

04 ගුරුළුගෝමී පඬිවරයා අමාවතුර රචනා කිරීමේදී
i අවස්ථා නිරූපනය
ii සිද්ධි නිරූපනය
ඉතාමත්ව සජීවීව සහෘදයා වෙත ඉදිරිපත් කිරීමට සමත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විවරණයක යෙදෙන්න.

නැතහොත්

සිංහබාහු නාට්‍යයේ එන සුප්පා දේවිය
i සෙනෙහෙබර බිරිඳක් මෙන්ම
ii දාරක සෙනෙහස පිරීගිය මවක ලෙස
නිරූපණය කරන්නට කතුවරයා දැක්වූ ශක්‍යතාව උදාහරණ දෙක බැගින්වත් සපයමින් පැහැදිළි කරන්න.

5,6, 7 යන ප්‍රශ්න අතරින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු වචන 100 ක් පමණ සෑහේ.

5. වස්සානය පැදිපෙළ රසාලිප්ත වීමට බලපෑ ප්‍රමුඛ සාධකයකි අපූර්ව කාව්‍යයෝක්ති නිර්මාණයෙහි
ලා කවියා දැක්වූ සමත්කම. පැහැදිලි කරන්න.

6. අපටත් වැසිකිළියක් කෙටිකතාවේ සිද්ධි හා අවස්ථා නිරූපණය කිරීමෙහිලා ජයතිලක මහතා
දැක්වූ දක්ෂතාව අගයන්න.

7. ළමාසිතේ දේශානුරාගී හා ජාතිකාභිමානි හැඟීම් ජනනය කිරිම කතුවරයාගේ අභිප්‍රාය
වී ඇත.උදාහරණ දෙමින් සනාථ කරන්න.